# දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 17 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට කිසිදු භාණ්ඩ හා සේවාවක් ලබා නොගෙන විවිධ වැය විෂයයන්ට හර කරමින් එකතුව රු.1,820,858 ක මුදලක් ණයහිමියන් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2016 නොවැම්බර් 09 දින ලංකා බැංකුව වෙතින් ලබා ගත් රු.5,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතුව වෙනුවෙන් ලැබිය යුතු රු.70,479 ක පොලී මුදල මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.163,707 ක යන්ත්‍ර හා උපකරණ සහ රු.185,900 ක් වූ ලීබඩු උපකරණ ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.6,859,798 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.9,652,945 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,793,147 ක පහත වැටීමක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 3,767 | 2,940 | 3,633 |
| (ii) බදු කුලී | 682 | 581 | 100 |
| (iii) බලපත්‍ර ගාස්තු | 138 | 138 | - |

#### 2.2.2 වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.4,592,264 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර වර්ෂය තුළදී එම හිඟයෙන් රු.1,834,321 ක් හෙවත් සියයට 40 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කළ ආදායම රු.2,298,166 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් රු.1,487,330 ක් හෙවත් සියයට 65 ක් අයකරගෙන තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 වන විට අය විය යුතු හිඟ වරිපනම් ශේෂය රු.3,568,370 ක් වූ අතර ඉන් වර්ෂ 3 ඉක්ම වූ හිඟය රු.379,707 ක්, වර්ෂ 5 ඉක්ම වූ හිගය රු.1,639,148 ක් හා වර්ෂ 10 ඉක්ම වූ හිඟය රු.1,073,032 ක් විය. මේ අනුව හිඟ වරිපනම් බදු අයකරගැනීමේ දුර්වලතාවයක් පැවතුනි.

2.2.3 **ප්‍රචාරක දැන්වීම් ආදායම**

(අ) 2015 දෙසැම්බර් 28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4 ඡේදය ප්‍රකාරව සකස් කරන ලද දැන්වීම් පුවරු සඳහා නියම කරන ලද ගාස්තු අය කළ යුතු වුවත්, ප්‍රචාරක දැන්වීම් සඳහා නියම කරන ලද ගාස්තු අය කළ යුතු වුවත් ප්‍රචාරක දැන්වීම් සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර සම්මත කරගෙන ගාස්තු අයකර නොතිබුණි.

(ආ) නියැඳියක් ලෙස සභා බල ප්‍රදේශයට අයත් සපුගහවත්ත, දික්හේන, පරණ පොලීසිය අසල පන්සල හංදිය හා තුඩුගල හන්දිය පිළිබඳව 2016 නොවැම්බර් 02 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සවි කර තිබූ විවිධ ප්‍රමාණයේ දැන්වීම් පුවරු 83 ක් සඳහා සභාවට අය විය යුතු රු.140,102 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 16,387,258 |
| (ii) | මුද්දර ගාස්තු | 12,506,302 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් / කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) සභාවට අයත් පොදු පහසුකම් වෙනුවෙන් වෙන් කළ ඉඩම්වල සහ සුසානභූමිවල පදිංචි අනවසර පදිංචිකරුවන් හා අනවසර වෙන්කරගැනීම් ඉවත් කර සභා සතු ඉඩම්වල අයිතිය හා ඉඩම්වල සුරක්ෂිතභාවය වෙනුවෙන් අවධානය යොමු කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) පරිසර අධිකාරිය විසින් සභා බල ප්‍රදේශය තුළ පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 25 ක් හඳුන්වා දී ඇතත් ආසන්න වසර හතරක් තුළ බලපත්‍ර ලබාගෙන තිබුණේ ඉන් කර්මාන්ත 05 ක් සඳහා පමණි.

(ඇ) මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් විසින් ආහාර හා ඖෂධ විධිවිධාන පනතේ විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස ප්‍රාදේශීය සභා සීමාව තුළ ආහාර අලෙවි කරන ලද ස්ථානයන් වැටලීම සඳහා අත්තිකාරම් ලබාගෙන වැටලීම් සිදු කර නඩු පවරා ගාස්තු

අයකරගෙන තිබුණද, ඒ පිළිබඳව සභාවේ වාර්තා වී නොමැති අතර නඩු පැවරීම් තුලින් ලද උසාවි දඩ මුදල් ගෙන්වාගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ සවි කර තිබූ විදුලි සංදේශ කුළුණු 07 ක් සඳහා සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ඉ) 1992 සැප්තැම්බර් 30 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ සංවර්ධන රෙගුලාසි චක්‍රලේඛ අංක 6 හා 2.1 ඡේදය හා 1986 මාර්තු 10 දිනැති එම අධිකාරියේ අංක 393/9 දරන ගැසට් පත්‍රයේ නියෝග අංක 22(i) පරිදි අනු බෙදීමට අදහස් කරන ඉඩම් කොටස හෝ භූමි භාගය හෙක්ටයාරයකට වැඩිවන අවස්ථාවකදී වීථි අත්හැරීමෙන් පසු ඉඩමේ විශාලත්වයෙන් සියයට 10 කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු සථානවලින් වෙන් කළ යුතු බවත් එම වෙන් කළ කොටස පැවරුම් ඔප්පුවක් මගින් සභාවට පවරා ගෙන නොතිබුණි. පසු ගිය වර්ෂ කීපයක ඉඩම් වෙන්දේසි ලිපිගොනු, ලේඛන, අයිතිය පැවරීමේ ඔප්පු පිළිබඳව 2015 සැප්තැම්බර් 25 දින කරන ලද නියැදි හා භෞතික පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉඩම් අනු බෙදුම් 07 කින් සභාවට පවරන ලද පිළිවෙලින් පර්චස් 18.2, 67.5, 169.75, 127.5, 146 හා 64.4 ක් වූ ඉඩම් කොටස්වලට අදාල හිමිකම් ඔප්පු සභාවට ලබාගැනීමට 2017 අගෝස්තු 28 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි.

(ii) පොදු පහසුකම් සඳහා සභාවට පවරා තිබූ කපුගහවත්ත කොට්ටයාහේන හා පෙට්ටිගලවත්ත හි පර්චස් 126.5 ක් හා පර්චස් 67.5 ක් පිළිබඳව 2015 සැප්තැම්බර් 25 දින කරන ලද භෞතිකව පරික්ෂාවේදී එම ඉඩම්වල සීමා මායිම් පැහැදිලිව හඳුනාගත හැකි ලෙස හඳුනාගැනීමේ සළකුණු යොදා සීමා මායිම් වෙන් කොට නොතිබූ අතර එය සභාවට අයත් පොදු ඉඩම් කොටස බවට හඳුනාගත හැකි ලෙස සභාවේ නාමපුරුවක්ද එහි සවි කර නොතිබුණි.

(iii) පිඹුරු අංක 3612005, 3622005 මගින් අනුබෙදීම අනුමත කර තිබූ කඳනගොඩ කැලේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 602.3 ක් වීම නිසා ඉන් සියයට 10 ක ප්‍රමාණය ලෙස පර්චස් 60.23 ක ඉඩම් කොටසක් සභාවට පැවරිය යුතු වුවද පවරා තිබුණේ පර්චස් 44 ක් වූ ඉඩම් කොටසකි. සභාවට ගෙවා තිබූ සියයට 1 ක බදු මුදල සමග

සැසඳීමේදී සභාවට අඩුවෙන් පවරා තිබූ ඉඩම් ප්‍රමාණය පර්චස් 16.23 ක් වූ අතර එහි වටිනාකම රු.292,140 ක් විය.

3.2 **<u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>**

සභාව විසින් නිසි අධිකාර බලයක් ලබා නොගෙන උපලේඛනවල ඇති එහෙත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැති රු.630,476 ක් වූ විවිධ තැන්පතු ලියා හැර තිබුණි.

3.3 **<u>කොන්ත්‍රාත් පාලනය</u>**

මාර්ගයේ සම්පූර්ණ දිග මීටර් 75.2 ක් වූ අතර දිග මීටර් 49.32 දක්වා වූ මාර්ගය කොන්ක්‍රීට් කිරීමෙන් පසු බෝක්කුවක් ඉදි කිරීම සඳහා මාර්ගය ඉතිරි කර නැවත ඉතිරි මීටර් 30.88 කොන්ක්‍රීට් කර තිබුණි. කොන්ත්‍රාත්කාර සමිතිය 2015 ජුනි 30 වන විට වැඩ අවසන් කර තිබූ නමුත් ඉදි කිරීමට සැලසුම් කර තිබූ බෝක්කුව 2017 අගෝස්තු 28 වන විටත් ඉදිකර නොතිබුණි.

3.4 **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කෙරේ.

(i) ඝණ අපද්රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොතිබුණි.

(ii) සභාව සතු කසළ බැහැර කිරීමේ ස්ථානයක් නොමැති අතර ඉඩම් හිමියන්ගේ වාචික අවසරය මත යම් කිසි ස්ථානයකට කසළ බැහැර කර තිබුණි. එකී භූමිවලට කසළ මුදාහැරීම සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොමැති අතර එලෙස කසළ මුදාහැරීම ආසන්නයේ ඇති පරිසර පද්ධතීන්ට හානිදායක ලෙස බලපා තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය